**ශීර්ෂය 318 - ඌව පළාත් සභාව - 2025**
------------------------------------------

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

" පරමාදර්ශිත තිරසර සංවර්ධනයක්"

**1.2 මෙහෙවර**

"ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා සම්පත් බලමුළු ගැන්වීම සහ ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම."

**1.3 කාර්ය භාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදන හා වියදම**

ඌව පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 51,097 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් මිලියන 47,898 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රුපියල් මිලියන 3,199 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.26 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මි. | රු.මි. | රු.මි. | (%) |
| පුනරාවර්තන | 42,142 | 41,688 | 454 | 1.08 |
| මූලධන | 8,955 | 6,210 | 2,745 | 30.66 |
| එකතුව | 51,097 | 47,898 | 3,199 | 6.26 |

**3. විගණන නිරීක්ෂණය**

318 - ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.